JMC JAYASEKERA
MANAGEMENT CENTRE
“Pioneers in Professional Education”

# වරලත් ගණකාධිකරණය – BL 01

# මූල්‍ය ගිණුම්කරණය

Rukkantha Wanniarachchige

Reading for MBA (PIM-SJP), BBA (Acct.) Hons., ACA

# හවුල් ව්‍යාපාර

JMC VLearning
"your virtual learning partner"

# හවුල් ව්‍යාපාර

- එක් අයෙකුට වැඩි පිරිසක් (2-20) එකතු වී ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන ව්‍යාපාර හවුල් ව්‍යාපාර වේ.
- 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත මේ සඳහා බලපායි
- ගිවිසුමක් ඇතිව හෝ නැතිව හවුල් ව්‍යාපාර ආරම්භ කළ හැකිය.




JMC vLearning
"your virtual learning partner"

# හවුල් ව්‍යාපාර

| විස්තරය | ගිවිසුමක් සහිත | ගිවිසුමක් රහිත |
|---|---|---|
| බලපාන නීතිය | ගිවිසුමේ එකඟ වූ කොන්දේසි | 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය |
| ප්‍රාග්ධනය | සෑම හවුල්කරුවෙකුම දායක වේ. එක් එක් හවුල්කරු දායක වූ ප්‍රාග්ධනය, පවත්වාගත යුතු අවම ප්‍රාග්ධනය සඳහන් වේ. | සෑම හවුල්කරුවෙකුම සමානව ප්‍රාග්ධනයට දායක විය යුතුය. |
| ලාභ බෙදා ගැනීම | කැමති පදනමකට (ප්‍රාග්ධනය යෙදූ වූ පදනම වැනි) ලාභ බෙදාගත හැකිය. | සෑම හවුල්කරුවෙකු අතරම ලාභය සමානව බෙදී යා යුතුය. |
| ප්‍රාග්ධනය මත පොලී | එක් එක් හවුල්කරු ව්‍යාපාරයට යෙදූ වූ ප්‍රාග්ධනයට පොළියක් ගෙවා ගත හැකිය. පොලී ප්‍රතිශතය ගිවිසුමේ සඳහන් විය යුතුය. | ප්‍රාග්ධනය මත පොලී ගත නොහැක. |

# හවුල් ව්‍යාපාර

| විස්තරය | ගිවිසුමක් සහිත | ගිවිසුමක් රහිත |
|---|---|---|
| හවුල්කරු වේතන | හවුල් ව්‍යාපාරයෙන් හවුල්කරුවන්ට වේතන ගෙවා ගැනීමට එකඟ විය හැකිය. එහෙත් එය හවුල් ව්‍යාපාරයේ වියදමක් නොව ලාභ විසර්ජනයකි. ඉතිරි ලාභය බෙදීමට පෙර සාධාරණ මූලික ආදායමක් හවල්කරුවන්ට ලැබීම තහවුරු කිරීම මෙහි අරමුණයි. | වේතන සඳහා හිමිකමක් නැත. |
| ගැනිලි | හවුල්කරුවන්ට තම ලාභයෙන් ගැනිලි කිරීමට හැකියාවක් ඇත. ගැනිලි සඳහා සීමාවක් පැනවීම සහ ගැනිලි අධෛර්යමත් කිරීමට පොලියක් පැනවිය හැක. | ගැනිලි පොළී අය කළ නොහැක. |

JMC vLearning your virtual learning partner

# හවුල් ව්‍යාපාර

| විස්තරය | ගිවිසුමක් සහිත | ගිවිසුමක් රහිත |
|---|---|---|
| හවුල් ව්‍යාපාරයට ණය සැපයීම | ණය සැපයිය හැකි අතර එය හවුල් ව්‍යාපාරයේ බාහිර වගකීමක් ලෙස දක්වයි | ණය සැපයිය හැකි අතර එය හවුල් ව්‍යාපාරයේ බාහිර වගකීමක් ලෙස දක්වයි |
| ණය මත පොළිය | හවුල් ගිවිසුමේ එකඟ වන පොළී අනුපාතයක් අය කළ හැකිය<br>එය හවුල් ව්‍යාපාරයේ වියදමක් වන අතර ලාභ විසර්ජනයක් නොවේ | වාර්ෂිකව 5% පොළියක් අය කළ හැකි අතර<br>එය හවුල් ව්‍යාපාරයේ වියදමක් වන අතර ලාභ විසර්ජනයක් නොවේ |

.

JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න අංක 01 - හවුල්කරු ලාභ බෙදීම

හිරු, සඳු, තරු හවුල් ව්‍යාපාරය 7 : 3 : 5 අනුපාතයට ලාභ බෙදා ගනී. 150,000 ක ලාභයක් ලබා ඇත්නම් ඒ ඒ හවුල්කරු ලබන ලාභය කොපමණ වේද?

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 02 - හවුල්කරු වේතන සහ ලාභ බෙදීම

බිල් සහ බෙන් 2 : 1 අනුපාතයට ලාභ බෙදා ගනී. ලාභය බෙදීමට ප්‍රථම ඒ ඒ හවුල්කරුට වාර්ෂිකව රු. 10,000 ක වේතනයක් ගෙවීමට එකඟ වී ඇත. වේතන අඩු කිරීමට පෙර ලාභය රු. 26,000 නම් ඒ ඒ හවුල්කරුට ලැබෙන ආදායම කොපමණ වේද?

JMC vLearning
"your virtual learning partner"



## හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ කේවල ස්වාමී ව්‍යාපාරයකින් වෙනස් වන්නේ කෙසේද?

1. එක් එක් හවුල්කරු ව්‍යාපාරයට යෙදූ වූ අරමුදල් වෙනම පෙන්වීම.
2. හවුල් ගිවිසුමේ වගන්ති අනුව හවුල් ව්‍යාපාරයේ ලාභය හවුල්කරුවන් අතර විසර්ජනය කිරීම.

JMC vLearning "your virtual learning partner"

# ප්‍රාග්ධන ගිණුම්



- හවුල්කරුවන්, හවුල් ව්‍යාපාරයට යෙදූ වූ ප්‍රාග්ධනය, වෙන වෙනම ප්‍රාග්ධන ගිණුම්වල පෙන්වයි.
- හවුල්කරුවාට තමන් යෙදවූ ප්‍රාග්ධනය නැවත ගැනීමට අයිතියක් ඇති නිසා එය ප්‍රාග්ධන ගිණුමක වෙන වෙනම අභ්‍යන්තර වගකීමක් ලෙස (බැර) පෙන්වයි.
- මෙය බොහෝවිට ස්ථාවර ශේෂයන් වේ.

JMC vLearning "your virtual learning partner"

# ජංගම ගිණුම

- හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයට රඳවා ඇති ලාභය පෙන්නුම් කිරීමට ජංගම ගිණුම භාවිතා කරයි.
- ජංගම ගිණුමේ ශේෂය සාමාන්‍යයෙන් බැර ශේෂයක් වේ.
- හවුල් ව්‍යාපාරය ලාබ ලබන විට මෙම ශේෂ ඉහල යන අතර ලාභය ගැනිලි කරන විට සහ අලාභ ලබන විට මෙම ශේෂය අඩු වේ.



JMC vLearning
"your virtual learning partner"

# ජංගම ගිණුමේ සටහන් වන අයිතම

| අයිතමය | ශේෂය අඩුවේද?/වැඩිවේද? |
|---|---|
| ලාභ කොටස | ↑ |
| අලාභ කොටස | ↓ |
| වේතන කොටස | ↑ |
| ගැනිලි | ↓ |
| ප්‍රාග්ධනය මත පොලී | ↑ |
| ගැනිලි මත පොලී | ↓ |



JMCvLearning
"your virtual learning"

**මතක තබාගන්න** - සාමාන්‍යයෙන් ජංගම ගිණුමේ ශේෂය මත පොලී නොගෙවෙයි.

## සහතික කළ අවම ලාභ කොටස

යම් හවුල්කරුවෙකුට සහතික වූ අවම ලාභයක් පිළිබඳ කොන්දේසියක් තිබිය හැකිය.

### ප්‍රශ්න අංක 03

සුසිත්, ප්‍රමිත් සහ මලිත් 4 : 3 : 3 අනුපාතයට ලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යනු ලබයි.

සුසිත් සහ ප්‍රමිත් දෙදෙනාම වර්ෂයකට රු. 30,000 බැගින් වේතනයක් හිමි වේ. එහෙත් සුසිත්ට එහෙත් රු. 120,000 ක අවම ලාභ කොටසක් සහතික වී තිබේ. වර්ෂයේ ශුද්ධ ලාභය රු. 260,000 ක් නම් ලාභය විසර්ජනය කරන ආකාරය දක්වන්න.

# ගැනිලි ගිණුම

- ඒ ඒ හවුල්කරු මූල්‍ය වර්ෂය පුරා කරන ලද ගැනිලි වෙන වෙනම හඳුනා ගැනීමට ගැනිලි ගිණුමක් භාවිතා කරයි.
- එය වර්ෂය අවසානයේ ජංගම ගිණුමට මාරු කරනු ලබයි.

| | |
|---|---|
| ජංගම ගිණුම | හර |
| ගැනිලි ගිණුම | බැර |



JMC vLearning
your virtual learning partner

# හවුල්කරුවන් ව්‍යාපාරයට සැපයූ ණය මුදල්



- ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයට ණය මුදල් සැපයිය හැකිය.
- මෙය ප්‍රාග්ධනයක් නොව ණයකි. එමනිසා මෙම මුදල් හවුල් ව්‍යාපාරයේ වගකීම් තුල දක්වන අතර ප්‍රාග්ධන ගිණුම් තුල නොදක්වයි.
- එම වගකීම පියවිය යුතු කාලය අනුව ජංගම හෝ ජංගම නොවන වගකීම ලෙස දැක්විය හැකිය.

JMC vLearning "your virtual learning partner"

# ණය පොළී

හවුල් ගිවිසුම ප්‍රකාරව ණය සඳහා පොළියක් අය කළ හැකිය. පොළිය ගැන ගිවිසුමේ සඳහන්ව නොමැති නම් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව 5% ක වාර්ෂික පොළියක ලබාගත හැකිය.

- පොළිය හවුල් ව්‍යාපාරයේ වියදමක් වන අතර ලාභ විසර්ජනයක් නොවේ.
- ගෙවිය යුතු පොළිය ජංගම ගිණුමට බැර කෙරේ.



JMC vLearning
"your virtual learning partner"

# ශුද්ධ ලාභ අලාභ විසර්ජනය

හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හවුල් ගිවිසුමේ කොන්දේසි වලට අනුව හවුල්කරුවන් අතර බෙදා හැරීම ලාභ අලාභ ගිණුමේම දිගුවක් වන විසර්ජන ගිණුමෙන් සිදු කරයි.

**පියවර 01**

ශුද්ධ ලාභය / අලාභය ගණනය කර විසර්ජන ගිණුමට මාරු කරන්න.

ලාභාලාභ හර
විසර්ජන ගිණුම බැර

**පියවර 02**

ප්‍රාග්ධන පොළී සහ හවුල්කරු වේතන ජංගම ගිණුමට මාරු කරන්න.

ප්‍රාග්ධන පොළී - විසර්ජන ගිණුම හර
හවුල්කරු ජංගම ගිණුම බැර

හවුල්කරු වේතන - විසර්ජන ගිණුම හර
හවුල්කරු ජංගම ගිණුම බැර

JMC vLearning "your virtual learning partner"

# ශුද්ධ ලාභ අලාභ විසර්ජනය

## පියවර 03

ගැනිලි මත පොළී ගෙවීමට එකඟ වී ඇත්නම් එය ජංගම ගිණුමට මාරු කරන්න.

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම හර
විසර්ජන ගිණුම බැර

## පියවර 04

ඉතිරි වූ ලාභය හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදා ගන්නා අනුපාතයට බෙදාගත යුතුය.

ඉතිරි ලාභය =
(ශුද්ධ ලාභය + ගැනිලි පොළී - ප්‍රාග්ධන පොළී - හවුල්කරු වේතන)

විසර්ජන ගිණුම හර
හවුල්කරුවන්ගේ ජංගම ගිණුම බැර

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 04

පවන්, විනිත් සහ දිනේශ් 4 : 3 : 3 අනුපාතයට ලාබ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යනු ලබයි.

20X9 ඔක්තොම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා තොරතුරු හවුල් ව්‍යාපාරයේ ගිණුම්වලින් උපුටාගෙන ඇත.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ

| | |
|---|---|
| පවන් | රු. 20,000 |
| විනිත් | රු. 30,000 |
| දිනේශ් | රු. 24,000 |

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 04

20X8 නොවැම්බර් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂ

| | |
|---|---|
| පවන් | රු. 15,000 |
| විනිත් | රු. 10,000 |
| දිනේශ් | රු. 13,000 |

ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා 5% වාර්ෂික පොළියක් ගෙවනු ලබයි. 20X9 ඔක්තොම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 2,300 කි.

1. 20X9 ඔක්තොම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා එක් එක් හවුල්කරුවන්ට ප්‍රාග්ධන ගිණුම් සඳහා ගෙවිය යුතු පොළිය ගණනය කරන්න.
2. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය / අලාභය හවුල්කරුවන් අතර විසර්ජනය වන ආකාරය පෙන්වන්න.

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 05

ගවේෂ් සහ ලසල් 7 : 3 අනුපාතයට ලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි.

20X9 මැයි 31 න් අවසන් මූල්‍ය වර්ෂයට අදාල පහත සඳහන් හවුල් ව්‍යාපාරයේ වාර්තා වලින් උපුටාගෙන ඇත.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ

| | |
|---|---|
| ගවේෂ් | 200,000 |
| ලසල් | 140,000 |

20X8 ජුනි 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂ

| | |
|---|---|
| ගවේෂ් | 15,000 |
| ලසල් | 13,000 |

JMC vLearning
your virtual learning partner

# ප්‍රශ්න අංක 05

20X9 මැයි 31 න් අවසන් වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් පහත පරිදි මුදල් ලබාගෙන ඇත.

| | ගවේෂ් | ලසල් |
|---|---|---|
| 20X8 අගෝස්තු 31 | 10,000 | 7,000 |
| 20X8 නොවැම්බර් 30 | 10,000 | 7,000 |
| 20X9 පෙබරවාරි 28 | 10,000 | 7,000 |
| 20X9 මැයි 31 | 10,000 | 7,000 |

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 05

හවුල් ගිවිසුම අනුව ගැනිලි මත 12% ක වාර්ෂික පොලියක් ද, ප්‍රාග්ධන සහ ජංගම ගිණුම බැර ශේෂ සඳහා 12% ක වාර්ෂික පොළියක් ද අය වේ.

ලසල්ට වාර්ෂික වේතනය රු. 15,000 කි.

20X9 මැයි 31 න් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය 102,940 කි.

**අවශ්‍ය වන්නේ,**

1. ඒ ඒ හවුල්කරුවන්ගේ ගැනිලි පොලිය ගණනය කිරීම.
2. 20X9 මැයි 31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාර විසර්ජන ගිණුම පිළියෙල කිරීම.
3. 20X9 මැයි 31 දිනට ජංගම ගිණුම්වල ශේෂ ගණනය කිරීම.

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 06

කසුන්, සනුක සහ නිමල් 5 : 3 : 2 අනුපාතයට ලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

20X5 ජනවාරි 01 දිනට ඔවුන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ.

| | ප්‍රාග්ධන ගිණුම් | ජංගම ගිණුම් |
|---|---|---|
| කසුන් | 24,000 | 2,000 |
| සනුක | 18,000 | (1,000) |
| නිමල් | 13,000 | 1,500 |

# ප්‍රශ්න අංක 06

ප්‍රාග්ධන ගිණුම් සඳහා වර්ෂයකට 10% ක පොළියක් හිමි වේ.

සනුක හා නිමල්ට වසරකට රු. 8,000 ක වේතන බැර කළ යුතුය.

20X5 ජූලි 01 දින කසුන් රු. 20,000 ක පුද්ගලික ණය මුදලක් ව්‍යාපාරයට දී ඇත.

මෙම ණය මුදල් 20X8 ජුනි 30 වන විට ගෙවා නිම කළ යුතුය. මෙම ණය මුදල සඳහා වර්ෂයකට 15% බැගින් පොළියක් සෑම අර්ධ වර්ෂයක් අවසානයේ කසුන්ගේ ගිණුමට බැර කළ යුතුය.

20X5 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කසුන්ගේ ණය පොළී අය කිරීමට පෙර ලාභය රු. 63,000 කි.

JMC VLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 06

හවුල්කරුවන්ගේ ගැනිලි,

| | |
|---|---|
| කසුන් | 16,000 |
| සනුක | 16,500 |
| නදිමාල් | 19,000 |

වර්ෂය අවසානයේ මුළු ගැනිලි මත 10% පොළියක් අය කරයි.

**අවශ්‍ය වන්නේ,**

20X5 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්.

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 07

සසංක, ඩිලාන් සහ නුවන් ලාභාලාභ 3 : 2 : 1 අනුපාතයට බෙදාගන්නා හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. හවුල් ගිවිසුමේ කොන්දේසි පහත පහත වේ.

1. හවුල්කරුවාගේ වාර්ෂික ප්‍රාග්ධන පොළිය 12%
2. නුවන්ට රු. 6,000 ක වාර්ෂික වේතනයක් ලැබිය යුතු වේ.
3. වර්ෂය අවසානයේ ගැනිලි මත 5% ක පොළියක් අය කළ යුතුය.
4. සසංක සැපයූ ණයට වාර්ෂික 5% ක පොළියක් ගෙවිය යුතුය.

20X5 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගැනීම් පහත පරිදි වේ. රු.

# ප්‍රශ්න අංක 07

| | | |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| සසංක | 20,000 | |
| ඩිලාන් | 8,000 | |
| නුවන් | 6,000 | 34,000 |
| | | |
| **ජංගම ගිණුම්** | | |
| සසංක | 3,500 | |
| ඩිලාන් | (700) | |
| නුවන් | 1,800 | 4,600 |
| සසංකගේ ණය ගිණුම | | 6,000 |
| | | **44,600** |

JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 07

20X6 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ගැනිලි පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| සසංක | 6,000 |
| ඩිලාන් | 4,000 |
| නුවන් | 7,000 |

ණය පොලිය අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය 24,530 කි.

**ඔබ විසින්,**

20X6 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,

- විසර්ජන ගිණුම
- ප්‍රාග්ධන ගිණුම
- ජංගම ගිණුම පිළියෙල කරන්න.

JMC vLearning "your virtual learning partner"

# හවුල් ව්‍යාපාරයේ ඇතිවන වෙනස්කම්

- හවුල්කරුවෙකු විශ්‍රාම ගැනීම
- අළුත් හවුල්කරුවෙකු බඳවා ගැනීම

මෙවැනි වෙනස්වීමකදි හවුල් ව්‍යාපාරයේ කොන්දේසි වෙනස් වේ. ලාභ බෙදා ගැනීම් වෙනස් වේ.



JMC vLearning "your virtual learning partner"

# ලාභ විසර්ජන පියවර

| | |
|---|---|
| පියවර 01 | වෙනස්කමට පෙර සහ පසු කාලය හඳුනා ගන්න. |
| පියවර 02 | ලාභය පෙර සහ පසු කාලයට බෙදන්න.<br>• වෙනත් සඳහනක් කර නොමැති නම් ලාභය වර්ෂය පුරා සමානව බෙදී ගොස් ඇති බව උපකල්පනය කරන්න. |
| පියවර 03 | එලෙස බෙදූ ලාභ පෙර පැවති සහ නව කොන්දේසි අනුව විසර්ජනය කරන්න. |

JMC VLearning "Your virtual learning partner"

# ප්‍රශ්න අංක 08

හැරී සහ විලියම් ලාභාලාභ සමව බෙදා ගනී. 20X8 ඔක්තොම්බර් 01 වන දින කේට් හවුල්කරුවෙකු ලෙස බඳවාගෙන ඇති අතර එදින සිට හවුල් ව්‍යාපාරයේ ලාභය 4 : 4 : 2 අනුපාතයට බෙදා ගනී.

20X8 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයේ ලාභය 150,000 කි. මෙය හවුල්කරුවන් අතර බෙදි යන ආකාරය දක්වන්න.

JMC vLearning "your virtual learning partner"

# කීර්තිනාමය

යම් ව්‍යාපාරයක් කාලයක් තිස්සේ පවත්වාගෙන යන විට පහත හේතු නිසා කීර්තිනාමයක් නිර්මාණය වේ.

- ගුණාත්මක සේවාව
- පාරිභෝගික විශ්වාසය
- සේවක පක්ෂපාතීත්වය
- පාරිභෝගික ජනප්‍රියතාව

කීර්තිනාමය හේතුවෙන් පාරිභෝගිකයන් ව්‍යාපාරයට නැවත නැවත පැමිණේ. එය ව්‍යාපාරයේ අස්පෘශ්‍ය වත්කමකි.



JMC vLearning
"your virtual learning partner"

**කීර්තිනාමය** = **ව්‍යාපාරයේ වටිනාකම** − **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම් වටිනාකම**

**Goodwill**

# ප්‍රශ්න අංක 09

බබානිස් සහ සොබානිස් හවුල් ව්‍යාපාරය, ජබානිස්ව නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීමට තීරණය කර ඇත

එදිනට හවුල් ව්‍යාපාරයේ වටිනාකම රු. 750,000 කි. එදිනට පිළියෙල කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් රු. 375,000 කි. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය කොපමණ වේද?

# හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය

- හවුල් ව්‍යාපාරයේ හිමිකාරීත්වයේ වෙනසක් අති වූ විට වෙනස්වන දිනය තෙක් නිර්මාණය වූ කීර්තිනාමය පැරණි හවුල්කරුවන්ට බෙදා දිය යුතුය.
- වෙනස ඇති වූ පසු අනුපාතයට එම කීර්තිනාමය නව හවුල්කරුවන් අතර බෙදා හැරිය යුතුය.
- මේ අනුව කීර්තිනාමය වත්කම පොත්වල වාර්තා නොවන අතර නව හවුල්කරුගෙන් කීර්තිනාමයට අදාළ කොටසක් පැරණි හවුල්කරුවන් අතර බෙදි යාමක් ප්‍රාග්ධන ගිණුම් තුලින් සිදු වේ.



# ප්‍රශ්න අංක 10

ප්‍රශ්න 08 උදාහරණයේ හැරී, විලියම් සහ කේට් හවුල් ව්‍යාපාරයේ 20X8 ඔක්තෝම්බර් 01 දිනට කීර්තිනාමය රු. 300,000 ක් ලෙස සලකන්න. එම කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළ ගලපන ආකාරය දක්වන්න.

JMC vLearning
"your virtual learning partner

# ප්‍රශ්න අංක 11

අශේන් සහ දසුන් 1 : 1 අනුපාතයට ලාභ බෙදා ගනිමින් රථවාහන අළුත්වැඩියා ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 20X9/1/1 නවීන් මෙම ව්‍යාපාරයේ නව හවුල්කරුවෙකු ලෙස එකතු විය. එදිනට අශේන් සහ දසුන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ පිළිවෙලින් රු. 12,000 ක් සහ රු. 9,000 ක් විය. එසේම එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 5,000 ක් විය. නවීන් රු. 3,000 ක මුදලක් හවුල් ව්‍යාපාරයට ගෙන එන ලදී. එදින සිට හවුල් ව්‍යාපාරයේ ලාභ 2 : 2 : 1 අනුපාතයට බෙදාගැනීමට හවුල්කරුවෝ එකඟ විය.

කීර්තිනාම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙළ කරන්න